දිව්‍ය බිළිඳාණන්
ශාස්ත්‍රුවන්තයින්ට ප්‍රත්‍යක්ෂ වීමේ මංගලෝත්සවය **දේව ප්‍රකාශන** 05-01-14

## පළමුවන දේව ප්‍රකාශනය

යෙසායා 60:1-6

යෙසායා දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.

**ඔබේ දෙවිඳාණෝ ඔබේ තේජාලංකාරය වන සේක.**

ජෙරුසලම, නැගිටින්න, බැබළෙන්න, ඔබේ ආලෝකය දැන් උදා වී ඇත. සමිඳුන්ගේ තේජාලංකාරය ඔබ කෙරෙහි බැබළේ. පොළොව අඳුරෙන් ද ජාතීන් ගන අඳුරෙන් ද වසනු ලබන නමුත් සමිඳාණෝ ඔබ මත බබළන සේක. එතුමන්ගේ තේජාලංකාරය ඔබ කෙරෙහි පිස් වන්නේ ය. ජාතීන් ඔබේ ආලෝකය වෙතටත්, රජවරුන් උදා වන ඔබේ දීප්තිය දෙසටත් පැමිණෙනු ඇත. ඔබේ ඇස් ඔසවා අවට බලන්න. ඔව්හු සියල්ලෝ රැස් ව ඔබ වෙත එති. ඔබේ පුත්‍රයන් දුර සිට පැමිණෙනු ඇත. ඔබේ දූවරු උකුළේ හොවාගෙන ගෙනෙනු ලබති. මෙය දැක ඔබ ප්‍රීති වන්නහු ය. ඔබේ සිත ප්‍රීති ප්‍රමෝදයෙන් පිනා යන්නේ ය. මන්ද, මුහුද මගින් ගෙනෙන යසඉසුරු ඔබ වෙත ගලා එන්නේ ය. ජාතීන්ගේ වස්තුව ඔබ වෙත පැමිණෙන්නේ ය. ඔටුවන් සමූහයකින් යුත් තවලම් මිදියන් හා ඒපා දේශවලින් නුඹ වෙත රොක් වෙයි. ඔවුන් ෂෙබා දේශයෙන් රන් ද සුවඳ ද්‍රව්‍ය ද රැගෙන අවුත් සමිඳුන්ගේ ප්‍රශංසාව ප්‍රකාශ කරනු ඇත.”

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 72:1-2, 7-8, 10-13

ඔබගේ පිළිතුර: සියලු ජාතීහු සමිඳුන්ට මෙහෙ කරන්නෝ ය.

ගීය: දෙවිඳුනි, රජතුමාට විනිශ්චය කිරීමේ ඥානය දුන මැනව. ඒ රජ කුමරු හට යුක්තිගරුක ව ක්‍රියා කිරීමේ හැකියාව දුන මැනව. එවිට එතුමා ඔබේ ජනතාව සාධාරණ ලෙස පාලනය කරන්නේ ය. ඔබේ පීඩිත ජනතාවට යුක්තිය ඉටු කරන්නේ ය.

එතුමන් සමයෙහි දමිටු බව දියුණු වේවා! ඉර හඳ පවතින තෙක් සාමය පැතිරේවා. මුහුදින් මුහුදට එතුමාග් රජ දහන පැතිරේවා. යුප්‍රටීස් නදියේ සිට පොළොවේ කෙළවර දක්වා එසේ ම වේවා!

තාර්ෂිස්හි සහ ද්වීපවල රජවරු එතුමාට කප්පම් ගෙවන්නෝ ය. ෂෙබා සහ සේබාහි රජවරු පඬුරු පුදන්නෝ ය. එතුමන් අබිමුව රජවරු වැඳ වැටෙන්නෝ ය. සියලු ජාතීහු එතුමාට මෙහෙ කරන්නෝ ය.

එතුමා සහන පතා මොරගසන අසරණයන් මුදා ගත්තේ ය. පිහිට නැති පීඩිතයන් නිදහස් කර ගත්තේ ය. එතුමා දුගී දුප්පතුන්ට හා දුබලුන්ට අනුකම්පා කරන්නේ ය. දිළිඳුන්ගේ ජීවිත මුදා ගත්තේ ය.

## දෙවන දේව ප්‍රකාශනය

එපෙසි 3:2-3, 5-6

පාවුලු තුමන් විසින් එපෙසිවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

**සියලු ජාතීන්ට ගැළවීමේ සහභාගිකම ලැබේ.**

ඔබේ යහපත පිණිස සේවය කිරීමේ වරප්‍රසාදය දෙවියන් වහන්සේ මට භාර දී ඇති බව ඔබ ඇත්තෙන් ම අසා ඇත. මා ලුහුඬින් ලියා තිබෙන ලෙස මේ

රහස එළිදරව් වීමකින් මට ප්‍රකාශ කරන ලදී. ආදී පරම්පරාවල මනුෂ්‍ය වර්ගයාට ඒ අභිරහස ප්‍රකාශ නොකරන ලදී. එහෙත් දැන් ආත්මයාණන් කරණකොට ශුද්ධ අපෝස්තුළුවරන්ටත් දිවැසිවරුන්ටත් එය එළිදරව් කර ඇත. ඒ අභිරහස නම් සුබ අස්න කරණකොටගෙන ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ විජාතීන් ජුදෙව්වරුන් සමඟ හවුල් උරුමක්කාරයන් ද සභා ශරීරයේ හවුල් සාමාජිකයන් ද පොරොන්දුවේ හවුල් පංගුකාරයන් ද වන බවයි.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සුපුවත් ජය නද

මතෙව් 2:2

ආලේලූයා! ආලේලූයා!
අපි එතුමාණන්ගේ තාරකාව පෙරදිග දී දැක,
එතුමාණන්ට නමස්කාර කරන පිණිස ආවෙමු.
ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

මතෙව් 2:1-12

මතෙව් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**පෙරදිග දී තරුව දුටු ශාස්ත්‍රවන්තයෝ රජ ව උපන් උතුමාණන් වැඳීමට ආහ.**

හෙරෝද් රජු දවස ජුදයේ බෙත්ලෙහෙමෙහි ජේසුස් වහන්සේ උපන් කල, පෙර දිගින් ශාස්ත්‍රවන්තයෝ ජෙරුසලමට අවුත්, "ජුදෙව්වරුන්ට රජ ව උපන් උතුමාණෝ කොතැන්හි ද? අපි එතුමාණන්ගේ තාරකාව පෙරදිග දී දැක, එතුමාණන්ට නමස්කාර කරන පිණිස ආවෙමු"යි කීහ. එපවත් ඇසූ හෙරෝද් රජ ද මුළු ජෙරුසලම් ජනතාව ද කැළඹුණාහ. එකල ඔහු සෙනඟගේ සියලු නායක පූජකයන් ද විනයධරයන් ද රැස් කරවා, "ක්‍රිස්තුන් වහන්සේ කොතැන්හි උපදින සේක් ද"යි ඔවුන්ගෙන් විචාළේ ය. ඔව්හු කතා කොට, "ජුදයේ බෙත්ලෙහෙමෙහි ය, ඒ ගැන දිවැසිවරයා මෙසේ ලියා තිබේ, "එම්බා, ජුදා දේශයේ බෙත්ලෙහෙම, තී ජුදාගේ භූපතීන් අතර කිසි සේත් අල්ප නොවන්නී ය. මන්ද, මාගේ ඉශ්රායෙල් සෙනඟ පාලනය කරන මූලිකයෙකු තී කෙරෙන් නික්මෙනු ඇතැ"'යි ඔහුට කී හ. එකල හෙරොද් ශාස්ත්‍රවන්තයන් රහසින් කැඳවා, තාරකාව පෙනුණු වේලාව ඔවුන්ගෙන් හොඳින් දැනගෙන, "ඔබ ගොස් ඒ ළදරුවා ගැන හරි ලෙස විමසන්න. ඔබ විමසා සොයාගත් පසු, මාත් ගොස් උන් වහන්සේට නමස්කාර කරනු පිණිස මටත් දන්වන්න." කියා, ඔවුන් බෙත්ලෙහෙමට යැවී ය. රජුගේ බස් අසා ඔව්හු පිටත් ව ගියහ. පෙරදිග දී ඔවුන් දුටු තාරකාව, ළදරුවා සිටි තැනට අවුත් ඉහළින් නවතින තුරු, ඔවුන්ට පෙරටුවෙන් ගියේ ය. තාරකාව දැක ඔව්හු අතිශයින් ප්‍රීති ප්‍රමෝද වූ හ. ඔව්හු ගෙට පිවිස, ළදරුවා සිය මව වූ මරිය තුමී හා සමඟ සිටිනු දැක, පසග පිහිටුවා වැඳ, සිය කරඬු ඇර රන් ද, තුවරලා ද, ගන්ධරස ද යන පඬුරු උන් වහන්සේට පිදූ හ. තවද, හෙරොද් වෙත ආපසු නොයන ලෙස සිහිනයකින් දන්වනු ලැබූ ඔව්හු අන් මඟකින් සිය රට බලා ගියහ.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.